# දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව - 2020
***වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය***

## பண்டிகைகள் උත්සව - හැඳින්වීම

- **උත්සව යනු** සිංහල වචනය සඳහා දෙමළ භාෂාවෙන් වචන තුනක් භාවිතා වේ. ඒවා පහත පරිදි වේ: **விழா, பண்டிகை, திருவிழா**
- **விழா** යනු පොදු උත්සව වේ. **பண்டிகை** යනු ආගම හා සංස්කෘතිය මත පදනම් වේ. **திருவிழா / கோயில் உற்சவம்** යන මෙම උත්සවය කෝවිලේ දින කිහිපයක් අඛණ්ඩව පැවැත්වෙන විශේෂ පූජා වේ.
- මිනිස් ජීවිතයේ වැදගත් සිදුවීම් / විශේෂ දින.
- මිනිසුන් උත්සව සමරන්නේ ඔවුන්ගේ මනසට සහ ජීවිතයට සතුට ගෙන ඒම සඳහා ය.
- වසරේ පළමු, මැද හා අවසාන කොටස් වල උත්සව සමරනු ලැබේ.
- උත්සව පදනම් වන්නේ ආගම හා සංස්කෘතිය මත ය.

## උත්සව දිනට පෙර කළ යුතු දේ:

- ගේ දොර පිරිසිදු කිරීම.
- පින්තාරු (තීන්ත) කිරීම.
- මැටි ගෙවල්වල නම් බිම ගොම ගා පිරිසිදු කිරීම.
- ගල් ගෙය නම් අතුගා දැමීම, සේදීම
- විවිධ කෑම සහ රසකැවිලි වර්ග සෑදීම.

## උත්සව දිනයක කළ යුතු දේ:

- ගේ දොර පිරිසිදු කිරීම. **නිවස පුරා කහ දියර ඉසිනු ලැබේ. නිවසින් පිටත ගොම දියර සහ නිවස තුළ කහ දියර ඉසිනු ලැබේ.**
- විවිධ කෑම සහ රසකැවිලි වර්ග සෑදීම.

- අලුත් හෝ පිරිසිදු ඇඳුම් ඇඳීම.
- දෙමාපියන්ගෙන් සහ වැඩිහිටියන්ගෙන් ආශීර්වාද ලැබීම.
- ආගම ස්ථානවලට ගොස් දෙවියන්ට නමස්කාර කිරීම.
- ඥාතීන්ගේ සහ මිතුරන්ගේ නිවසට යාම.
- දුප්පතුන්ට උදව් කිරීම.

## උත්සව වර්ග:

- උත්සව ජාතිය, ආගම සහ සමය අනුව වර්ගීකරණය කර ඇත.
- උත්සව සාමාන්‍යයෙන් ආගම අනුව සමරනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ උත්සව දිනවල ඒ ආගමික අයට නිවාඩු ලබා දෙනු ලැබේ.




- හින්දු ජනතාව විසින් වසරේ වැඩි කාලයක් වුත සිටීම හා විවිධ උත්සව සැමරීම සිදු කරනු ලබයි. ඔවුන් අතර වුත, ආගමික උත්සව හා සංස්කෘතික උත්සව විශාල සංඛ්‍යාවක් ප්‍රචලිත ය. ඒ අතර පහත සඳහන් උත්සව වැදගත් ය.

## இந்து சமயப் பண்டிகைகள் :

- தைப்பொங்கல்
- சித்திரை வருஷப் பிறப்பு
- தீபாவளி




## தைப்பொங்கல் තෛපොංගල්



- දෙමළ මාස ක්‍රමයට අනුව <u>**තෛ**</u> (ජනවාරි 14 හෝ 15) මාසයේ පළමුවන දිනය තෛපොංගල් සමරනු ඇත.

- තෛ යනු ජනවාරි මාසයයි. පොංගල් යනු ඉදිමීම අර්ථය වේ. පොංගල් යන්නෙහි අරුත උතුරායාම හෙවත් පිටාර ගැලීම යන්නයි.
- තෛපොංගල් යන වචනයේ සිංහල අරුත වන්නේ උතුරා යාම හෙවත් පිටාර ගැලීම යන්නයි. කිරි උතුරවා යාමට සළස්වමින් සියලු දෙනාට සෞභාග්‍ය උදාවේවා යන්න ප්‍රාර්ථනා කිරීම තෛපොංගල් චාරිත්‍ර අතර මුල්තැනක් ගන්නවා.
- සූර්යයා ධනු රාශියේ සිට මකර රාශියට ප්‍රවේශ වීම <u>**මකර සංක්‍රාන්තිය**</u> ලෙස සඳහන් වේ.
- පොංගල් මෙම දිනයේදී සිදු කෙරේ, පොන්ගල් සමඟ සූර්යයාට නමස්කාර කිරීම.
- මිනිසා ඇතුළු සියලු ජීවින්ගේ පැවැත්මට ඉවහල් වන්නා වූ ආහාර, ජලය, සුළඟ, ආලෝකය ආදී වූ නොයෙකුත් ශක්තීන් සූර්යයා නිසා හට ගන්නා බව විස්වාසය වේ. එමෙන්ම කෘෂිකර්මයට අවශ්‍ය වැස්ස සහ ආලෝකය ලබා දෙන්නේ ද සූර්යයාම ය. එවන් වූ මගඟු සේවාවක් ඉටු කරන සූර්ය දෙවියන් හට තම කෘත ගුණ සැළකීම සඳහා හින්දු බැතිමතුන් විසින් තෛප්පොංගල් උත්සවය අවස්ථාවක් කර ගනු ලබයි.
- ගොවිතැනින් සරු අස්වැන්නක් ලබාගැනීමට දායක වූ හිරු දෙවියන්ට සැළකීම වෙනුවෙනුයි හින්දු බැතිමතුන් තෛපොංගල් උත්සවය පවත්ව.
- **මෙම උත්සවයේ අරමුණ:** නැවුම් සහල් මත මුලින්ම හිරුට පොංගල් බත් සෑදීම, ස්තූති කිරීම.
- **මෙම උත්සවයේ වෙනත් නම** - සූරියපොංගල්, උළවර් තිරුනාල්.

## තෛප්පොංගල් දිනයේදී කළ යුතු දේ:

- තෛප්පොංගල් දින හිරු උදාවට පෙර උදේ අවදි වීම.
- ගේ දොර පිරිසිදු කිරීම. නිවස පුරා කහ දියර ඉසිනු ලැබේ. නිවසින් පිටත ගොම දියර සහ නිවස තුළ කහ දියර ඉසිනු ලැබේ.

- ස්නානය කර පිරිසිදු කරගත් ඇඳුම් හෝ අලුත් ඇඳුම් ඇඳීම.
- නිවසේ ප්‍රධාන දොරටුවේ සහ පූජා කාමරයේ දොරටුවේ අඹ කොළ තොරණ බැඳීම.






- දේව රූපය සඳහා මල් තැබීම සහ ආලෝකකරණය කිරීම.





- මිදුල මැද ගොමවලින් වේදිකාවක් ලෙස සකස් කොට එහි කෝලම් රටා ඇඳීම කළ යුතු ය. මෙම **කෝලම්** රටාව **සෘජුකෝණාස්රාකාර හැඩයෙන්** හෝ **හතැරැස් හැඩයෙන්** යුක්ත වන අතර, ඒ සඳහා **හාල්පිටි, කහ කුඩු, කුංකුමම් හෝ රතු ගඩෝල් කුඩු** යොදා ගනු ලබයි. එම කෝලම් රටාවේ **සූර්යයාගේ රුවක්, නෙළුම් මල්, අශ්ව රථය, පුන් කළස වැනි කළයක්, පොංගල් බඳුන සහ උක් ගස්** ඇඳීම ද සිරිත වේ.

## தைப்பொங்கல் கோலம்









## தைப்பொங்கல் கோலம்







- කෙසෙල් කොළ අග්ගිස්සක වී නැතහොත් රතු කැකුළු හාල් අතුරා කුම්බම් / නිරෛකුඩම් (පුන් කළසක් වැනි කළය) තබනු ලැබේ. ගොම හෝ කහ පිටිවලින් ගණදෙවි අනුරුවක් තනා එහි මුදුනත ර්තණ ගසා එම ගණදෙවි අනුරුව කුම්බම් අසළ තබයි. පසුව කුම්බම් ඉදිරියෙන් ලිප බඳිනු ලබේ. **පුන් කළසක් තැබීමට අවශ්‍ය දේවල්:** **කළසක්, වී හෝ රතු කැකුළු හාල්, කෙසෙල් කොළ (අග්ගිස්සක), පොල් ගෙඩියක්, වතුර, අඹ කොළ (ඔත්තේ සංඛ්‍යාවෙන් - අවම කොළ පහක්), කෙසෙල් ඇවැරිය, පුලත්, බුවක් (ඔත්තේ සංඛ්‍යාවෙන්), පහන් දෙක (කුත්තු විළක්කු), මල්, ගොම හෝ කහ පිටිවලින් ගණදෙවි අනුරුවක්.**










- අලුත් භාජනයක් ගෙන සෝදා විභූති ගල්වා එම භාජනයට සඳුන් තිලකයක් සහ කුංකුම තිලකයක් තබනු ලැබේ.
- එම භාජනයේ කර කොටසේ ඉඟුරු කොළ, කහ කොළ සහ අඹ කොළ ආදිය බැඳ ගැනීම සිදු කරයි.
- භාජනය තුළට සම්පූර්ණයට ජලය දමා ඒ සමඟ කිරි (පොල්කිරි හෝ එළකිරි) ස්වල්පයක් ද දමනු ලැබේ.
- ඉන්පසු එම පොංගල් භාජනය ලිප මත තබනු ලැබේ.












- ගෘහ මූලිකයා විසින් පොංගල් බත සෑදීම ආරම්භ කරනු ලබයි. ගෘහණියන් විසින් පොංගල් වැඩ කටයුතු කරනු ඇත.
- කිරි ඉතිරෙන විට කුඩා ළමයි රතිඤ්ඤා දල්වා සතුටු වෙති.
- මේ අවස්ථාවේදී නිවැසියෝ **පොංගලෝ පොංගල්** ලෙස ශබ්ද නගා කියති.
- ඒ අනුව මෙම උත්සවයේදී කිරි කලයක් උතුරවා පිටාරගලා යාමට සැලැස්වීමෙන් සිය පවුලට සෞභාග්‍ය උදාකර ගැනීමට හින්දු ජනතාව අපේක්ෂා කරයි.



- ගෘහ මූලිකයා විසින් පොංගල් භාජනයට හාල් දැමීමට සැරසෙනු ලැබේ.
- බැදපු මුංඇට පියලි මිශ්‍ර කරන ලද රතු කැකුළු සහල් දෝතින්ම ගෙන පොංගල් භාජනය වටා තෙවරක් පැදකුණු කොට විත් එම සහල් පොංගල් භාජනයට දැමීම සිරිත වේ. මෙම ආකාරයට තුන්වාරයක් කිරීම සාමාන්‍යය සම්ප්‍රදාය වේ.



- හාල් හොඳින් තැම්බුනාට පසු පොල්කිරි හෝ එළකිරි දමනු ලැබේ. පසුව ගින්දර අඩුකොට හකුරු දැමීම සිදු කරයි. සමහරු හකුරු කිරිවලට මුසුකොට දමති.
- පසුව කරදමුංගු, කජු, මුද්දරස්පළම්, රටකජු වැනි දෑ එළඟි තෙලෙන් බැද හෝ නොමැතිව පොංගල් බතට එකතු කරයි.
- ඉන්පසු හොඳින් හැඳි ගා පොංගල් භාජනය ලිපෙන් ඉවත් කර ගනියි.
- මෙම පොංගල් බතට ලුණු දැමීම නොකළ යුතු ය.
- සූර්යා උදාවෙන විට මෙම පොංගල් සූර්ය දෙවියන්ට පූජා කළ යුතු ය.
- පළමුව කෙසෙල් කොළ අග්ගිස්සක පොංගල් ගුලි තුනක් තබනු ලැබේ. ඒ සමඟ පූජාව සඳහා මෝදකම්, වඩේ, වෙනත් රසකැවිලි වර්ග ද කෙසෙල්, අඹ, වරකා, උක් ආදී පලතුරු වර්ග ද තබනු ලැබේ.






- ඉන්පසු පූජාව ඇරඹේ. ගෙදර ප්‍රධානියා වන පියා විසින් පොල් බිඳ කපුරු පහන් දල්වන ලදුව නිවසේ සිටින සියලුම සාමාජිකයන් නැගෙනහිර දිශාවට වන්දනා කරනු ලබයි.



- දරුවන් විසින් තේවාරම් (දෙවියන් උදෙසා ගයන ගාථා) ගයනු ලැබේ.

- පියා විසින් පූජාව අවසන් කොට රතු පැහැති මල් සහ ජලය අතට ගනු ලැබේ. කිරි ඉතිර වූ ස්ථානය තුන් වරක් පැදකුණු කොට එම මල් සහ ජලය පූජාව නැබූ ස්ථානයේ දමයි. පසුව සූර්ය දෙවියන් වන්දනා කරයි. ඒ ආකාරයට අනෙකුත් සාමාජිකයෝ ද මල්දමා වන්දනා කිරීම සිදු කරයි.



- ඉන්පසු පොංගල් භාජනය මිදුලෙන් ගේ තුළට රැගෙන යන අතර, එය පූජා කාමරයේ තැනපත් කරනු ලැබේ.
- පසුව නිවසේ සියල්ලෝම කෝවිල වන්දනා කරති.
- කෝවිල වන්දනා කොට නිවසට පැමිණීමෙන් පසු පිසගත් පොංගල් සහ රසකැවිලි වර්ග නෑදෑ හිතමිතුරන් සමග බෙදා හදාගෙන භුක්ති විඳිමින් සතුටින් මෙම දිනය ගත කරනු ලබයි.
- දෙමළ භාෂාවෙන් පොංගල් බත පුක්කෛ, අමුදු ලෙස ද හඳුන්වනු ලැබේ.





## மாட்டுப்பொங்கல் / பட்டிப்பொங்கல் - මාට්ටුප් පොංගල් /පට්ටිප් පොංගල්

- කෘෂිකර්මාන්තයට දායකත්වය ලබාදෙන ගව මහේෂාදී සතුන්ට ද ගෞරව කිරීම තෛපොංගල් උත්සවයේ තවත් විශේෂත්වයකි.

- ගොවි ජනතාවට කෘෂි කර්මාන්තයේදී මහත් සේවාවක් සපයන ගවයින්ට කෘතගුණ සැලකීම සඳහා තෛප්පොංගල් දිනට පසු දින මාට්ටුප් පොංගල් සමරනු ලැබේ.
- ගවයා හින්දු ආගමේ ඉතා පූජනීය වස්තුවකි. එයට හේතුව ශිව දෙවියන්ගේ රථය වනුයේ නන්දි ගවයා වීමයි.
- මාට්ටුප්පොංගල් යනු ආගමික උත්සවයක් නොවන අතර එය හින්දු ජනතාව විසින් සමරනු ලබන සාමාන්‍ය උත්සවයකි.
- පළමුව ගවයන්ගේ අං සුද්ධ කොට වර්ණ ගත්වනු ලබයි.





- ඉන්පසු ගවයන්ව නහවා පිරිසිදු කොට කහ, සඳුන් වැනි මංගල ද්‍රව්‍යය අංවල සහ ගෙල ප්‍රදේශයේ ගල්වා ගෙජ්ජි බැඳ අලංකාර ලෙස සරසනු ලැබේ.
- ගවයන් ලැගුම් ගන්නා මඩුව සුද්ද පවිත්‍ර කොට කෝලම් රටා ඇඳ රතු මැටි ගා ගණදෙවි වන්දනා කිරීමෙන් පසු පොංගල් සාදනු ලැබේ.
- ගවයන්ට ද පූජා පවත්වනු ලබයි.





- සන්ධ්‍යාවේ ගවයාගේ ගෙලෙහි උක්ගස්, මුදල් ආදිය ලණු පොටක අමුණා මාලයක් ගෙස දමා වීදි දිගේ පෙරහැරේ රැගෙන යනු ලැබේ.

- මෙය මාට්ටුප්පොංගල් ලෙස හැඳින් වේ. මෙය හින්දු ජනතාවගේ සංස්කෘතිය උත්සවයකි.

## சித்திரைப் புத்தாண்டு - අප්‍රේල් අලුත් අවුරුද්ද



- මෙය දමිළ ජනතාවට පමණක් නොව සිංහල ජනතාවට ද එකසේ වැදගත් වන මහා සංස්කෘතික උත්සවයක්.
- දෙමළ දින දර්ශනයට අනුව වසරක් ආරම්භ වනුයේ ජනවාරි (තෛ) මාසයේ නොව අප්‍රේල් (සිත්තිරෛ) මාසයේ ය.
- සූර්ය දෙවියන් **මීන රාශියේ සිට මේෂ රාශියට ප්‍රවේශ වීම** මෙම **සිත්තිරෛප් පුත්තාණ්ඩු හෝ සිත්තිරෛ වරුඩප්පිරප්පු** ලෙස හැඳින්වේ.
- මෙය යෙදෙන්නේ දමිළ මාස ක්‍රමයට අනුව සිත්තිරෛ (අප්‍රේල්) මාසයේ ය. එනම්, අප්‍රේල් මස 14 හෝ 15 වේ.
- **මෙම උත්සවයේ වෙනත් නම්** - වරුෂප්පිරප්පු, සිත්තිරෛප් පුත්තාණ්ඩු, සිංහල - තමිළ් පුත්තාණ්ඩු.
- මෙදින තමා කළ පව් හා තමාට ඇති දෝෂ නිවාරණය වනු පිණිස කෝවිල් හා දේවාලවලදී බෙහෙත් වර්ග, මල් වර්ග, සුවඳ ද්‍රව්‍ය ආදිය මිශ්‍ර කොට සාදාගන්නා **මරුත්තුනීර්** නමැති ආලේපය හිස ගල්වා ස්නානය කිරීම කරයි.

 

- මරුත්තු නීර් හිස ගල්වා ස්නානය කොට අලුත් හෝ සෝදා පිරිසිදු කරගත් ඇඳුම් ඇඳ සූර්යයාට නමස්කාර කිරීම සඳහා නිවෙස්වල පොංගල් සාදා පූජා පවත්වනු ලැබේ.
- මෙදිනට බැතිමත්හු කොවිලේදී පූජා පවත්වන පූජකවරුන්ගේ සහ වැඩිහිටියන්ගේ ආශිර්වාද ලබා ගනිති.
- මුදල් ගනුදෙනු (කෛ විශේෂම්) ආදි සුබ වේලාවක් බලා සිදු කරනු ලැබේ. එහිදී බුලත් කොළයක් මත පුවක්, වී ටිකක්, කහ කැබැල්ලක් සහ මුදල් යන මේවා තබා ගනුදෙනු කළ යුතු ය. ගනුදෙනු කරන විට දෙන අය උතුරු දෙසටත් ලබා ගන්නා අය නැගෙනහිර දෙසටත් මුහුණු ලා සිටීම යහපත් ය.



- විවිධ රසකැවිලි වර්ග සාදනු ලැබේ. රස වර්ග හය කින් යුත් ආහාර (අරු සුවෛ උණවු) අනුභව කොට සතුටු වෙති.



- හින්දු ජනතාව අලුත් අවුරුද්දේදී කරනු ලබන සියලුම කාර්යයන් සම්බන්ධවම පාහේ එලාපල බැලීම සිදු කරති.
- ගනුදෙනු කිරීම, නැගමන් යාම, සී සෑම, අකුරු කියවීම, පෙර කළ වැඩ නැවත අලුත් අවුරුද්දේ ඇරඹීම ආදිය ද සුබ වෙලාවක් බලා සිදු කිරීම සාමාන්‍ය සිරිත වේ.
- අලුත් අවුරුද්දේ දී විනෝදාත්මක ක්‍රීඩා ලෙස පෙරපොල් ගැසීම (போர்த்தேங்காய் அடித்தல்), ලිස්සන ගගේ නැඟීම (வழுக்கு மரம் ஏறுதல்), කිළිත්තට්ටු ක්‍රීඩාව (கிளித்தட்டு), මී කිරි මුට්ටියට ගැසීම (தயிர் முட்டி உடைத்தல்), ගොන් කරත්ත සවාරි (மாட்டு வண்டிச் சவாரி) ආදී ක්‍රීඩාවල නිරත වීම ද සිදු කරනු ලැබේ.

## தீபாவளி - දීපාවලි උත්සවය





- දෙමළ මාස ක්‍රමයට අනුව ஐப்பசி (ඔක්තෝබර්) මාසයේ දීපවාලි උත්සවය සමරනු ලැබේ.
- **දීප සහ ආවලි** යන පද දෙකේ අර්ථය වන්නේ **පහන් පේළිය** (තීප වරිසෛ) යන්න වේ.
- විෂ්නු දෙවියන් විසින් ඉතාමත් දුර්ගුණයෙන් ඇතිව සිටි **නරහාසුරන්** නැමති අසුරයාව විනාශ කළ දිනය දීපාවලි දනය ලෙස විශ්වාසය කරනු ලැබේ.

- ඉහත සඳහන් කළ නරහාසුරන් නැමති අසුරයා ඉතා දරුණු අපරාධ ද පංචමහා පාපයක් ද කරමින් සිටි බවත්, මොහුගේ දුෂ්ට බව දරාහත නොහැකි වූ දේව ප්‍රජාව විෂ්ණු දෙවියන්ගෙන් පිහිට පැතූ බවත්, විෂ්ණු දෙවියන් විසින් නරහාසුරන්ව විනාශ කරන ලද දිනයේ ඔහු මිය යාමට ප්‍රථම විශේෂ ඉල්ලීමක් කරන ලද බවත් සඳහන් වේ.
- එනම්, තමා මිය යන මෙදින සියලු ලෝ වැසියා ආචාරශීලි ලෙස සිටිය යුතු බවත් පව්වලින් ඈත් වී දෙවියන් සිහි කරමින් කල්ගත කළ යුතු බවත් ය.
- මෙදින අලුයම හින්දු ජනතාව තල තෙල් ඇඟලා ස්නානය කොට පිරිසිදු වස්ත්‍ර ඇඳ පුද පූජා පවත් වනු ලබන අතර, රාත්‍රියේ දී පහන් දල්වා ගෙවල් දොරවල් හා ගෙමිදුල් ද කෝවිල් ද අලංකාර ලෙස සරසනු ලැබේ.
- පහන් දැල්වීමේ යථාර්ථය වනුයේ තමා අභ්‍යන්තරයේ තිබෙන්නා වූ කාමය, මෝහය, කෝපය, මදය, අහංකාරය යනාදි වූ දුර්ගුණයන් පේළියට තබා දැල්වෙන පහන් සේ දැල්වී විනාශ වී තමා තුළ ශාන්තිය ඇති වේවා යන්නවේ.
- මෙම දිනයේදී උපවාස හිඳ විෂ්ණු දෙවියන් වන්දනා කළහාත් **වෛකුණ්ඩ මෝක්ෂය** ලැබෙන බව ද හින්දු බැතිමත්හු විශ්වාසය කරති.
- ශ්‍රී ලංකාවට අමතරව හින්දු බැතිමතුන් වාසය කරන මහාරාෂ්ට්‍රය, බංග්ලාදේශය, නේපාලය, රාජස්ථානය, පංජාබය, මධ්‍ය ප්‍රදේශය, හිමාලය, ගුජරාතය ආදී ප්‍රදේශවල විවිධ කාරණා මුල්කරගෙන මෙම දීපාවලි උත්සවය සමරන බව විශේෂයෙන්ම කිව යුතු ය.
- අලුත විවාහ වූවන් තම ප්‍රධාන වසර ප්‍රධාන දීපවාලි **(தலைத் தீபாவளி)** ලෙස සැමරීම සිරිතකි.

## லட்டு





## முறுக்கு வகைகள்







## மோதகம்





## கொழுக்கட்டை









## அரியதரம்



## பயிற்றம் உருண்டை



## தட்டை வடை



## உழுந்து வடை

